**$G_2$ උපදෙස් - සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබා ඇති විෂයයන්ට අදාළව උපාධියේ විෂය සන්ධාරය 1/3ක් පවතින බවට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි වෙතින් තහවුරු ලිපිය ලබා ගැනීමට අදාළ උපදෙස්.**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් රජයේ විශ්වවිද්‍යාලයක් මගින් හෝ පාර්ලිමේන්තු පනතක් මඟින් පිහිටුවන ලද විශ්විද්‍යාලයක්/ උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් උපාධිය ලබා ඇති අයදුම්කරුවන් මෙම නිවේදනය සමඟ වෙබ් අඩවියේ අන්තර්ගත කර ඇති F1 ආකෘතිය බාගත කර ගෙන අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු I කොටස සම්පූර්ණ කර, තම උපාධි සහතිකයේ හා සවිස්තර ප්‍රතිඵල සහතිකයේ පිටපතක් සමඟ තමා උපාධිය හදාරන ලද විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත තමා විසින් හෝ තමා විසින් නම් කරනු ලබන අයෙකු මගින් ඉදිරිපත් කල යුතුය.

02. එකී උපාධි සහතිකය අනුව විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී විසින් ලබාදෙනු ලබන නිර්දේශ ඇතුළත් I හා II කොටස් සම්පූර්ණ කරන ලද F1 ආකෘතිය, සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

03. මෙහිදී ඔබ විසින් අයදුම්කරන ලද ගැසට් නිවේදනයට අදාළව සටහන 4 හෝ සටහන 6 යටතේ දක්වා ඇති උපාධියේ විෂය සන්ධාරය (1/3) / හදාරා ඇති බව තහවුරු කිරීම අවශ්‍ය වන විෂයයන් සඳහා ඔබ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇත්නම් එකී සියලු විෂයයන්ට අදාළව එක් F1 ආකෘතියක් මඟින් ඒ ඒ විෂයට අදාළ උපාධියේ විෂය සන්ධාරය/ හදාරා ඇති බව තහවුරු කළ යුතුය.

04. එසේම ඔබ විසින් මෙම උපාධියේ විෂය සන්ධාරය සනාථ කිරීමේ ලේඛනය ඔබට හිමි සම්මුඛ පරීක්ෂණ දිනයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එබැවින් ඔබ විසින් F1 ආකෘතිය සම්පූර්ණ කර 2026.10.20 දිනට පෙර අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය.

05. තවද එකී ලේඛන අනුව විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීගේ නිර්දේශය ලබා දීමට අදාළව මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ නියාමනය වන රජයේ විශ්වවිද්‍යාල හා මෙම අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය/ආරක්ෂක අමාත්‍යාංශය මගින් නියාමනය වන රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල දැනුවත් කර ඇත.

06. එසේම ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත විෂය සන්ධාරය සනාථ කිරීමට අවශ්‍ය වන විෂයන්ට අදාළව F1 ආකෘතිය ඉදිරිපත් කර එකී අවශ්‍යතාවය සම්පූර්ණ කළ බව තහවුරු කිරීම අනිවාර්ය වේ. **එබැවින් ඔබ නියමිත පරිදි 2026.10.20 දිනට පෙර විෂය සන්ධාරය තතවුරු කිරීමේ ආකෘතිය අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත භාර දීමට කටයුතු නොකිරීමෙන් සිදුවන අපහසුතා සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.**

07. එසේම යම් අයදුම්කරුවකු උපාධිය හදාරා ඇත්තේ ඉහත 01 ඡේදයේ සඳහන් වන විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් නොවන අවස්ථාවලදී ඔවුන් විසින් හදාරා ඇති උපාධියේ විෂය සන්ධාරය සනාථ කර ගැනීමට අදාළව ක්‍රියා කලයුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට අදාළ වෙබ් නිවේදන ඉදිරි කාලය (2026.10.15 සිට 2026.10.30) තුළ මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරනු ඇත. ඔබ එම කාණ්ඩය යටතේ වන විශ්වවිද්‍යාලයකින් උපාධිය හදාරා ඇති අයදුම්කරුවකු නම් එකී උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බවද දන්වා සිටිමි. එබැවින් එවැනි අයදුම්කරුවන් මෙම F1 ආකෘතිය සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය